නිපුණතාව 08 - සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමෙහි ලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.

නිපුණතා මට්ටම 8.1 - වෙළෙඳපොල අසමත් වීමට හේතු විමර්ශනය කරයි.

<u>වෙළෙඳපොළ අසමත් වීම -</u>

සමාජයේ යහපත උදෙසා හිඟ සම්පත් බෙදා වෙන් කිරීමෙහි ලා වෙළෙඳපොළ යාන්ත්‍රණය අපොහොසත් වීම වෙළෙඳපොළ අසමත් වීම ලෙස හැඳින්වේ.

<u>වෙළෙඳපොළ අසමත් වීම කෙරෙහි බලපාන සාධක -</u>

1.සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වීම.

2.ආදායම් බෙදී යාමේ විෂමතාව

3.සාර්ව ආර්ථික අස්ථායිතාව

<u>සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාව -</u>

සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාව සඳහා අවශ්‍ය වන කොන්දේසිය වන මිල,ආන්තික පිරිවැයට සමාන වීම (P = MC) කොන්දේසියෙන් බැහැරව කටයුතු කිරීම සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාව යන්නෙන් අදහස් වේ.

- ආර්ථිකය සතු හිඟ සම්පත් සමාජයට හිතකර අයුරෙන් බෙදී නොයාම නිසා සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වේ.

<u>ප්‍රශ්න -</u>

1.සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වීමට බලපාන හේතු මොනවාද?
2.පොදු භාණ්ඩ යනු කුමක්දැයි හඳුන්වා ඒවායේ ලක්ෂණ නම් කරන්න.
3.ගෝලීය පොදු භාණ්ඩ,අර්ධ පොදු භාණ්ඩ,ශුභසාධන භාණ්ඩ උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
4.සාර්ව ආර්ථික අස්ථායිතාව යනු කුමක්ද?
5.ආදායම් බෙදී යාමේ විෂමතා ඇති වීම කෙරෙහි බලපාන හේතු නම් කරන්න.